# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2386/28 – 2024 මැයි 31 වැනි සිකුරාදා – 2024.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR//15/10/2010.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.12.17 දිනැති හා අංක 2258/54 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිලියන්දල, මාම්පේ, පී.එස්.පෙරේරා මාවත, අංක 103 හි පිහිටි ලංකා ආරක්ෂක සේවා සංගමය හා කොළඹ 10, ටී.බී.ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.10.13 දිනැති A 72/2021 ප්‍රදානය පළ කරනු ලැබූ 2023.12.04 දිනැති හා අංක 2361/03 දරන ගැසට් නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම සඳහා 2024.03.28 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ.ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 41996 – 18 (2024/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.

2023 දෙසැම්බර් මස 04 දින 2361/03 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම

නඩු අංකය: A/72/2021
IR/15/10/2010

ලංකා ආරක්ෂක සේවා සංගමය,
අංක 103, පී. එස්. පෙරේරා මාවත,
මාම්පේ,
පිළියන්දල.

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10

*දෙවන පාර්ශ්වය*

පෙනී සිටීම
පළමු පාර්ශ්වය වෙනුවෙන් - ඩබ්.එම්.ඩී. විජේවික්‍රම මහතා
දෙවන පාර්ශ්වය වෙනුවෙන් - නිතීඥ ප්‍රසංගා අයිලප්පෙරුම - නීති නිලධාරි,
නිතීඥ දිල්හානි රත්නායක මිය.

**ප්‍රදාන පත්‍රයේ දෝෂ නිවැරදි කිරීම**

2023 දෙසැම්බර් මස 04 වන දින ප්‍රසිද්ධ කරන ලද අංක 2361/03 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද උක්ත ආරාවුල පිළිබඳව ප්‍රදානයේ පහත සඳහන් මුද්‍රණ දෝෂ නිවැරදි විය යුතුය.

*ගැසට් පත්‍රයේ* 3A පිටුවේ 3 වන ජේදයේ සඳහන් "ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ඩී.ජී. කුලරත්න මහතා සමග දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරිනී ප්‍රසංගා අයිලප්පෙරුම මිය පෙනී සිටින ලදී'', ලෙස සඳහන්ව ඇති අතර එහි ඩී.ජී කුලරත්න වෙනුවට ඩී.ජේ. ප්‍රනාන්දු ලෙස නාමය සංශෝධනය විය යුතුය.

තව ද, 7A පිටුවේ අනු අංක 26 යටතේ 0355 අංක දරන ඩී.ජී. ප්‍රනාන්දු යන නම ඩී.ජේ. ප්‍රනාන්දු ලෙස සංශෝධනය විය යුතුය.

එම ප්‍රදානයේ ඇතුළත් අනෙකුත් කරුණුවල වෙනසක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

ආචාර්ය කේ.ඒ.එස්.කීරගල,
බේරුම්කරු.

2024 මාර්තු මස 28 වැනි දින,

EOG 05 - 0197

---

මාගේ අංකය - IR/COM/04/2021/188

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.06.28 දිනැති හා අංක 2338/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.06.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, කොට්ටාව, අමුඇටමුල්ල පාර, නො. 1551/5/17 හි පදිංචි එච්.එච්. ආර්.කේ.හේරත් මිය සහ නුගේගොඩ, හයිලෙවල් පාර, අංක 170 හි පිහිටි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A /49/2023 හා 2023.12.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ.ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මිකරණ අධිකරණයේදීය

නඩු අංකය: A/49/2023
IR/com/04//2021/188

එච්.එච්. ආර්.කේ.හේරත්,
නො. 1551/5/17,
අමුඇටමුල්ල පාර,
කොට්ටාව, පන්නිපිටිය.

*පැමිණිලිකරු*

එදිරිව

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
නො.170, හයිලෙවල් පාර, නුගේගොඩ.

වගඋත්තරකරු

අතර පවතින ආරාවුල

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1955 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව ඒ සඳහා ඉදිරිපත් වූ එහි පරිපාලන නිලධාරිනි එච්.එච්.ආර්.කේ.හේරත් මහත්මියට යම් අසාධාරණයක් සිදු වී තිබේද එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඒ මහත්මියට හිමිවිය යුතු සහනයක් කවරේද යන්න වේ.

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් පැමිණිලිකාර පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය 2023.07.11 දින බේරුම්කරණ අධිකරණය වෙත කැඳවන ලද අතර, ඒ ඒ පාර්ශ්වයන්ගේ පළමු විස්තර ප්‍රකාශ 2023.08.10 දිනට හෝ ඊට පෙර ලබා දිය යුතු බවත් එමෙන්ම නැවත පරීක්ෂණය 2023.08.10 වන දින කැඳවීමට නියෝග කෙරුණි.

2023.08.10 වන දින යලි නඩුකරය කැඳවන ලද අතර, දෙපාර්ශ්වය පෙනී සිටින ලදී. පැමිණිලි පාර්ශ්වය විසින් නියමිත පරිදි පළමු විස්තර ප්‍රකාශනය බේරුම්කරණ අධිකරණය වෙත හා දෙවන පාර්ශ්ව වෙත ලබා දී තිබුණි. මෙදින දෙවන පාර්ශ්වය නීතිපති දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනීම සඳහා කල් ඉල්ලා සිටී.

ඒ අනුව නඩුකරය යලිත් 2023.09.04 සඳුදා ප.ව.2.30 ට කැඳවීමට නියෝග කෙරුණි. එදිනම පැමිණිලිකාරියගේ හා අලුතින් බඳවා ගත් සහකාර අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික ලිපිගොනුවල සහතික පිටපතක් බේරුම්කරණ අධිකරණය වෙත ලබා දිය යුතු බවට දෙවන පාර්ශ්වය වෙත නියෝග කෙරුණි.

2023.09.04 වන දින ප.ව.2.30 ට පරීක්ෂණය යලි ආරම්භ කෙරුණි. වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජනය ඇත. සමථයට ඇති ඉඩ ප්‍රස්ථා සාකච්ඡාවට භාජනය විය. පෙත්සම්කාරිය ඉල්ලා ඇති සහනය එනම් සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි පිහිටුවීම මූලික අයිතිවාසිකම් කඩවීමක් සේ සලකා ඇයට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යා හැකි බවත් එය බේරුම්කරණ අධිකරණයේ විෂය පථයට නොගැනෙන බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් ප්‍රකාශ කරන ලදී. ඉදිරියේදී යලි සහකාර අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වුව හොත් එම තනතුරට යලි බඳවා ගැනීමේදී පෙත්සම්කාරියට සැලකිල්ලට දැක්වීම හෝ ඇයට මූල්‍ය අලාභයක් සිදුව ඇත්නම් ඊට සහනයක් සැලසීමට හැකි බව යෝජනා වූ තවත් සමථ කොන්දේසියකි. මෙම තත්වයන් යලි දෙපාර්ශ්වය විසින් සලකා බලා කිසියම් එකඟතාවයක් ඇති කර ගැනීමේ හැකියාව සලකා බලන ලෙස මෙම බේරුම්කරණ අධිකරණය දෙපාර්ශ්වයටම නියෝග කෙරුණි. මෙදින පැමිණිලිකාරියගෙන් හා අලුතෙන් බඳවා ගත් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ ලිපිගොනු පිටපත් ගරු අධිකරණය භාර ගන්නා ලදී. මීළඟ නඩු දිනයට දින නියම කෙරුණි.

2023.09.18 වන දින යලිත් මෙම නඩුකරය කැඳවන ලදී. පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ නියෝජනය පවතී. දෙවන විස්තර ප්‍රකාශන ලබා දුන් අතර, එය දෙපාර්ශ්වය හුවමාරු කරගන්නා ලදී. ලිඛිත දේශන අවසන් වේ. 2023.10.17 වන දින ප.ව.1.30 ට යලි පරීක්ෂණයට නියම කෙරුණි. එදින සාක්ෂි විමසීම් සිදු කරන බැවින් ඊට සුදානමින් පැමිණිය යුතු වේ.

2023.10.17 වන දින ප.ව.1.30 ට නඩුකරය යලි කැඳවන ලදී. දෙපාර්ශ්වය පෙනී සිටී. සාක්ෂි විභාගය ආරම්භ කිරීමට සූදානම් වේ. එම අතරතුර දෙවන පාර්ශ්වයේ නීතිඥවරුන් ඉල්ලා සිටියේ තම අධ්‍යක්ෂ මණ්ඩලය සමග කිසියම් සමථයකට සාක්ෂාත් කිරීමට අපේක්ෂිත බැවින් ඒ සඳහා අවස්ථාවක් සලසා දෙන ලෙසය. එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම ඔක්තෝබර් මස අගදී පැවැත්වෙන බවත් යෝජනා විය. ඒ අනුව කිසියම් සමථයකට එළඹීම පිළිබඳව සලකා බැලීම සඳහා නඩුකරය 2023.11.21 වන දින දක්වා යලි කල් තැබීමට තීරණය කෙරුණි.

සමථයට එකගතා නොමැති බැවින් 2023.11.21 වන දින පරීක්ෂණය පැවැත් වූ අතර දෙවන විස්තර ප්‍රකාශන හුවමාරු කර ගන්නා ලදී. මූලික විරෝධතා අනුව මෙම නඩුව පවත්වාගෙන යා නොහැකි බවට දෙවන පාර්ශ්වය පවසයි. එම මූලික විරෝධතා පිළිබඳ සාක්ෂි විමසීමට ආරම්භ කිරීමට තීරණය කරමි.

2023.12.13 වන දින ප.ව.2.30 ට සාක්ෂි විභාගය ආරම්භ වේ. මූලික විරෝධතා පිළිබඳව සාක්ෂි කැඳවන ලදී. ඒ අනුව සාක්ෂි අවසන් කරමි. පරීක්ෂණය අවසන් කෙරුණි.

එච්. එච්. ආර්. කේ. හේරත් මිය හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර, පවතින කාර්මික ආරාවුල බේරුම්කරණ අධිකරණය විසින් සලකා බැලීමේදී වග උත්තරකාර පාර්ශ්වය හෙවත් දෙවන පාර්ශ්වය වන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මෙම අධිකරණයෙන් අයැද සිටියේ,

අ) මූලික විරෝධතාවයන් පිළිගනිමින් ඉල්ලුම්කාරියගේ ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කරන ලෙසත්,

ආ) එසේම බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති යොමුව නිෂ්ප්‍රභා කරන ලෙසත්,

ඇ) නඩු ගාස්තු හා

ඈ) ගරු අධිකරණය සුදුසු යැයි හැගෙන වෙනත් සහනයක් ලබා දෙන ලෙසත්ය.

මෙම මූලික විරෝධතාවයන් ද සැළකිල්ලට ගෙන ගරු බේරුම්කරණ අධිකරණය දෙපාර්ශ්වය වෙතින් සවිස්තරාත්මක ප්‍රකාශන කැඳවනු ලැබීය.

පැමිණිලිකාර පාර්ශ්වය හෙවත් පළමු පාර්ශ්වය තම පළමු හා දෙවන විස්තර ප්‍රකාශන තුලින් පහත සඳහන් කරුණු සම්පිණ්ඩනය කර තිබුණි.

01. පැමිණිලිකාරිය ජාතික ප්‍රවාහන අධිකාරියෙහි වසර 15 කට වඩා සේවා කාලයකුත්, පරිපාලන නිලධාරී තනතුරේ වසර 11 ක කාලයකුත් සේවය කොට ඇත. ඒ අනුව සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට අයදුම්පත් කැඳවන අවස්ථාවේදී අයදුම්පත් කැඳවීමට අදාළ සියළු සුදුසුකම් සපුරා තිබුණි. එසේ තිබියදී මූලික සුදුසුකම් සපුරා නොමැති බාහිර අයදුම්කරුවෙකු එම තනතුරට තෝරාපත්කර ගැනීම. ඒ තුලින් බරපතල අසාධාරණයක් හා අයුක්තියක් සිදු කිරීම හා සුදුසුකම් සපුරා නොමැති අයෙකු එම තනතුරට පත් කිරීම නීති විරෝධී වීම.

02. අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් පැවතිය දී හා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් පැවතියදී ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොගෙන අයදුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාව වන විට බඳවා ගැනීම් පටිපාටියේ මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවෙකු තෝරා ගැනීම, අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව ලකුණු ලබා දීමේ ක්‍රමවේදය නිවැරදි නොවීම. අයදුම්කරුවන් 13 දෙනෙකු අදාළ තනතුරට අයදුම් කර තිබූ අතර, ඉන් 07 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ඇත. ඒ අනුව අයදුම්පත් කැඳවීම බඳවා ගැනීමේ පටිපාටියට අනුව හා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව කටයුතු කර ඇතත් සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ පටිපාටිය හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු නොකිරීම.

03. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිවැරදිතාවය ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් අනුගමනය කර එම්. ඩී. සී. එම්. පෙරේරා මහතා අදාළ තනතුරට බඳවා ගැනීම, වෙනත් පාර්ශ්වයකගේ ඉල්ලීම් අනුව 2021.02.09 දිනැති 2020/129 අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව නැවත අයදුම්පත් කැඳවීමට තීරණය වීම. එසේම 2001.10.15 දින පැවති ප්‍රවාහන අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් සුදුසුකම් ඇති අයගෙන් බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවා තනතුරට පත් කිරීමට යෝජනා වීම.

04. පෙත්සම්කාරිය සම්මුඛ පරීක්ෂණයේදී පිළිගත නොහැකි පරිදි 04 වන ස්ථානයට පත්වීම හා මූලික සුදුසුකම් නොමැති අයෙක් තනතුරට තෝරා පත් කර ගෙන තිබීම. ඔහු මාස 06 ක පරිවාස කාලයක් යටතේ කොන්ත්‍රාත් පත්වීමක් ලබා දීම, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය තිබුණත්, සභාපතිතුමා විසින් ස්ථිර පත්වීමක් පිරිනමා තිබීම. මෙම පත්වීම කම්කරු දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිෂන් සභාව හා ප්‍රවාහන අමාත්‍යංශයෙහි උපදෙස් අනුව කටයුතු නොකරමින් ලබා දී තිබීම.

වග උත්තරකාර පාර්ශ්වය හෙවත් දෙවන පාර්ශ්වය වන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය තම නීතිඥවරුන් මගින් පහත සඳහන් කරුණු බේරුම්කරණ අධිකරණය වෙත සම්පිණ්ඩනය කොට තිබුණි.

01.වගඋත්තරකාර ආයතන සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට නියමිත පරිදි බඳවා ගැනීම සඳහා අංක 2018/26 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කොට ඇති අතර, බඳවා ගැනීමේ පටිපාටියේ 5:4 වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන කමිටුවක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ බඳවා ගැනීම සිදු කිරීම නිර්දේශ කර ඇත. ඒ අනුව අයදුම්පත් 13 ක් අතරින් සම්මුඛ පරීක්ෂණයේදී එම්.ඩී.ඩී.එම්.පෙරේරා මහතා තෝරා ගනු ලැබීය. අංක 2020/19 දරන තොරතුරු පත්‍රිකාව මඟින් මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත.

02.සම්මුඛ පරීක්ෂණයේදී ඉහලම ලකුණු ලබා ගත් අයදුම්කරු වෙත පත්වීම ලබා දී ඇත. පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයේදී 04 වන ස්ථානයට පත්ව ඇති බැවින් ඇයට මෙම නඩු නිමිත්තට අදාළ අගතියක් හෝ කිසිදු අසාධාරණයක් සිදුවී නැත. ගරු අමාත්‍ය තුමාගේද වැඩිදුර නිර්දේශ මත සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර සඳහා සේවා පත්වීම කොන්ත්‍රාත් පදනම මත මාස 06 ක පරිවාස කාලයකට යටත්ව ලබා දී ඇත.

03. දෙපාර්ශ්වයට ලබා දී ඇති ලිඛිත විස්තර ප්‍රකාශනයෙහි හා ඊට අදාළ ඇමුණුම් සම්බන්ධව පහත සඳහන් කරුණු බේරුම්කරණ අධිකරණය නිරීක්ෂණය කර ඇත.

**පළමු පාර්ශ්වය පිළිබඳ නිරීක්ෂණය**

1.1. පැමිණිලිකාරිය වන හේරත් හිටිහාමිලාගේ රංගනා කල්‍යානි හේරත් මිය කළමනාකරණ අභ්‍යාසලාභී අනියම් තනතුරට 2005.01.04 දිනැති ලිපිය මගින් පත් කොට නැත. ඇය 2005.01.04 වන දින සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට එදිනම පත්වීම් ලැබීමට කටයුතු කොට ඇත.

1.2. පැමිණිලිකාරිය 2005.10.31 දිනැති ලිපියක් මඟින් viii ශ්‍රේණියේ ලිපිකරු තනතුරට පත් කර ඇත. පත්වීම් ලිපියට අනුව ඇය 2005.10.30 දින සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට ඇති අතර, පත්වීම පෙරදානම් කොට 2005.10.13 දින සිට ලබා දී ඇත.

1.3. 2009.07.03 දිනැති පත්වීම් ලිපිය මගින් පැමිණිලිකාරිය මාණ්ඩලික තනතුරට පත් කර ඇත. ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය 2008.12.19 දින පැවති අතර, පත්වීම 2009.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

1.4. පැමිණිලිකාරියට 2010.02.01 දිනැති ලිපිය මඟින් පරිපාලන නිලධාරී තනතුරට පත් කර ඇත. ඊට අදාල සම්මුඛ පරීක්ෂණය 2008.12.19 වන දින පැවති අතර, 2009.01.01 දින සිට මෙම පත්වීම ලබා දී ඇත.

මින් පැහැදිලි වන්නේ මාණ්ඩලික සහකාර තනතුරට පත් කිරීමට පැවති සම්මුඛ පරීක්ෂණය පාදක කරගෙනම 2009.01.01 දින සිට පැමිණිලිකාරිය වැඩ බලන පරිපාලන නිලධාරිනිය ලෙස සිදු කර ඇති බවය. පත්වීම් එදින සිට 2009.11.05 වන දින දක්වා කාලය තුල එම තනතුරේ සේවයේ යෙදීමේදී එම කටයුතු විධිමත්ව හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සැලකිල්ලට ගෙන 2010.02.01 දින සිට පරිපාලන නිලධාරී තනතුරට පත් කර ඇති බවය.

මෙම සියළුම පත්වීම් එකම සභාපතිවරයෙකු විසින් සිදු කර ඇති බවද නිරීක්ෂණය වන අතර, ඒ සම්බන්ධව ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හෝ අනුමැතියන් බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් වී නැත.

**දෙවන පාර්ශ්වය පිළිබඳ නිරීක්ෂණ**

2.1. බඳවා ගැනීම් පටිපාටිය අනුව අදාල තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසු තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 26/2018 ඉදිරිපත් කොට ඇත. ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව විධිමත් පරිදි අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් තෝරා පත්කරගෙන ඇත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට 05 දෙනෙකු සහභාගී වී ඇති අතර, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හා වාහන නියාමනය බස් රථ, ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් යන බාහිර නිලධාරීන් දෙදෙනෙක් ද නියෝජනය කොට තිබුණි.

2.2. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 2020/28 මගින් අනුමැතිය ලබාගෙන එම්.ඩී. ඩී. එම්. පෙරේරා මහතා තෝරා පත් කර ඇති අතර, 2022.03.04 දිනැති ලිපිය මඟින් සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට අදාළ පත්වීම් ලිපිය ප්‍රදානය කොට ඇත.

බේරුම්කරණ අධිකරණය විසින් වැඩි දුරටත් 2023.12.14 වන දින වැඩිදුරටත් සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී. දෙවන පාර්ශ්වය තම

පළමු විස්තර ප්‍රකාශනය තුලින් හා දෙවන විස්තර ප්‍රකාශනය තුලින් මෙම නඩු නිමිත්ත බේරුම්කරණ අධිකරණයෙහි පවත්වාගෙන යා නොහැකි බවට තර්ක ඉදිරිපත් කර ඇත. එම තර්කයට ප්‍රමාණවත් තොරතුරු පළමු පාර්ශ්වය ලබා දී නොමැති බැවින් තවදුරටත් මෙම නීති කෘත්‍යය ඉදිරියට පවත්වා ගෙන යන්නේද නැද්ද යන්න තීරණය කිරීම සඳහා මූලික සාක්ෂි විමසා බලන ලදී.

වග උත්තරකාර පාර්ශ්වය තවදුරටත් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ අදාළ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව අනුමත සේවා පුරප්පාඩු වගඋත්තරකාර ආයතනයේ තවදුරටත් නොපවතින බවත්, මෙම නඩුවට අදාළ පුරප්පාඩුව අදාළ නීති රෙගුලාසීන්ට අනුකූලව පුරවා ඇති බවත්, ඒ අනුව මෙම ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කර ඇති සහනයන් නීතිමය රාමුව තුල ප්‍රායෝගිකව ලබා දීමට හැකියාවක් නොමැති බවය. මෙහිදී පළමු පාර්ශ්වය වෙනුවෙන් සැළකර සිටින්නේ මෙම නඩුවට පාදක වී ඇති කරුණ වන්නේ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව ඒ සඳහා ඉදිරිපත් වූ පළමු පාර්ශ්වයට යම් අසාධාරණයක් සිදුව තිබේද එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඇයට හිමි විය යුතු සහනයන් කවරේද යන්න වේ. මේ පිළිබඳව කාර්මික ආරාවුල් පනත යටතේ සාධාරණ හා යුක්ති සහගත අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන ගරු බේරුම්කරණ අධිකරණයට යොමු කොට ඇති අතර, සාධාරණ හා යුක්ති සහගත අධිකරණ බලය යටතේ ඇයට හිමිවිය යුතු සහන සම්බන්ධව ගරු බේරුම්කරණ අධිකරණයෙන් අභිමතය පරිදි සහන ප්‍රදානය කර ගත හැකි බවට පළමු පාර්ශ්වය වෙනුවෙන් ගෞරවයෙන් අයැද ඇත.

ඉහත තර්ක විතර්ක පාදක කොට ගනිමින් ගරු බේරුම්කරණ අධිකරණය විසින් ඉල්ලුම්කාරිය වෙතින් හා දෙවන පාර්ශ්වය වෙතින් වැඩිදුරටත් සාක්ෂි විමසා සිටින ලද අතර, ඉන් අනතුරුව බේරුම්කරණ අධිකරණය පහත සඳහන් තීන්දු ප්‍රකාශන ලබා දෙනු ලැබේ.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වන එම්. එම්. ආර්. කේ. හේරත් මිය ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව ඒ සඳහා ඉදිරිපත් වූ ඇයට යම් අසාධාරණයක් සිදුව ඇති බව නිරීක්ෂණය නොවේ. ඒ අනුව පැමිණිල්ල නිශ්ප්‍රභා කිරීමට තීරණය කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම තීරණය බාධාවක් නොවේ.

*ආචාර්ය* **කේ.ඒ.තිලකරත්න,**
(බේරුම්කරු)

2023 දෙසැම්බර් මස 30 වන දින

EOG 05 - 0198

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.